

# දේශපාලකයන්ට කඩේ යන කලාකරුවෝ

*ඇමෙරිකාවේදී ජාත්‍යන්තර සම්මානයක් දිනා දිවයිනට කීර්තියක් ගෙනා ජගත් චමිලගේ සම්මානය ජැක්සන් ඇන්තනි වැනි නළුවෙක් දිනා දිවයිනට ආවානම් පිළිගැනීමේ උත්සවය මිට වඩා වෙනස්වීමට ඉඩ තිබෙන්නේ ජගත් චමිල මේ වනතුරු කඩේ යන කලාකරුවෙකු නොවන නිසාය.*

අද අපේ රටේ ප්‍රධාන ජාතික පුවත්පත්වල කඩේ යන කලාකරුවෝ ගැන කතා කරති. අපේ රටේ දුගී ජනයා කඩේකට යන්නේ බඩු මුට්ටු මිලදී ගැනීමටය. ඒ අතේ හරි හම්බ කළ මුදලටත් වඩා ලැබුණු වැටුපද කඩේටම පූජා කරමින්, වැඩිපුර පොතට ණයද එකතු කරමින් ජීවිතේ ගැටගහගන්නටය. ඔවුන් දස අතේ කල්පනා කරමින් මහන්සි වී මාසෙ අන්තිමට ලබා ගනනා වැටුප කඩේටම පූජා කරන්නේ ජීවත් වීම මරණයට වඩා උතුම් නිසාය. ක්‍රමයෙන් කඩේ ආදායම දිනෙන් දින ඉහළට යනවිට ඒ ජීවිත ක්‍රම ක්‍රමයෙන් පහළට යන්නේ ඔවුන්ටත් නොදැනීමය. එහෙත් කලාකරුවන් කඩේ යනවා කියන කියමන් අරුත එයට වඩා බොහෝ වෙනස්ය. ඔවුන් කඩේ යන්නේ බලයේ ඇති රජයට හා එහි අද අපේ රටේ ප්‍රධාන ජාතික පුවත්පත්වල කඩේ යන කලාකරුවෝ ගැන කතා කරති. අපේ රටේ දුගී ජනයා කඩේකට යන්නේ බඩු මුට්ටු මිලදී ගැනීමටය. ඒ අතේ හරි හම්බ කළ මුදලටත් වඩා ලැබුණු වැටුපද කඩේටම පූජා කරමින්, වැඩිපුර පොතට ණයද එකතු කරමින් ජීවිතේ ගැටගහගන්නටය. ඔවුන් දස අතේ කල්පනා කරමින් මහන්සි වී මාසෙ අන්තිමට ලබා ගනනා වැටුප කඩේටම පූජා කරන්නේ ජීවත් වීම මරණයට වඩා උතුම් නිසාය. ක්‍රමයෙන් කඩේ ආදායම දිනෙන් දින ඉහළට යනවිට ඒ ජීවිත ක්‍රම ක්‍රමයෙන් පහළට යන්නේ ඔවුන්ටත් නොදැනීමය. එහෙත් කලාකරුවන් කඩේ යනවා කියන කියමන් අරුත එයට වඩා බොහෝ වෙනස්ය. ඔවුන් කඩේ යන්නේ බලයේ ඇති රජයට හා එහි නායකයන්ට ආවඩා නිකම්ම සිටිමට නොව මල්ල තර කර ගැනීමටය. අද සමහර කලාකරුවන් මල්ලක් රැගෙන හිස් අතින්ම කඩේ ගොස් මල්ල පුරවාගෙන යහමින් වැජඹෙන්නේ කරගැට පිරි අත්වලින් අත්පොළසන් නැගූ, තමන්ව ඔසවා තැබූ ජනතාවටද හූ හඬ තලමිනි.

අපේ රටේ දේශපාලන පොර පිටිය තුළ කඩේ නොගිය කලාකරුවෙක් නැති තරම්ය. මාගේ දැනීමේ හැටියට සිංහල සිනමාව පටන් ගත්දා



ලක්ෂ්මන් කොඩිතුවක්කු

සිටම වාගේ කලාකරුවෝ තමන්ගේ දේශපාලන පාට පක්ෂ හා නායකයන් වෙනුවෙන් කඩේ ගියෙය. රුක්මණී දේවියගේ සිට මෑතකදී ටෙලි ක්ෂේත්‍රය තුළින් ජනගත වූ පබා දක්වාම වූ නිළියන්ද, එඩී ජයමාන්නගේ සිට ප්‍රවීන නළු ජැක්සන් ඇන්තනි දක්වාම කඩේ යන්නට පටන් ගත්තේ ජනතාවගේ දුක හා එය යුගයේ අවශ්‍යතාවයක් බව ජනතාවට ඒත්තු ගන්වමිනි. අන්තිමේදී ඒ කලාකරුවෝ තම ජනප්‍රියවාදී හොරණෑව පාවිච්චි කරමින් නායක මැති ඇමතිවරුන් වෙනුවෙන් ප්‍රශස්ත ගී ගයති. එහෙත් එවකට පවතින විපක්ෂය වෙනුවෙන් කඩේ යන කලකරුවෝ එම විපක්ෂය බලයට පත්වන තුරු මාධ්‍යයට හා ජනතාවට ජනතාවාදීන් වී ජනතාව වෙනුවෙන් බෙරිහන් දෙන කලාකරුවන්ය. ඊට පසු පවතින රජයේ කඩේ බඩු හිස්වී පාරට වැටෙන විට ඒ ආණ්ඩුව වෙනුවෙන් ප්‍රශස්ත ගී ගයන්නට තවත් කලාකරුවන් පිරිසක් සැහැදී පැහැදී සිටිති. තවත් පිරිසක් කඩේ වහන්නට වෙන බව දැන කරණමක් ගසා බලයට පත්වන බඩු ඇති කඩේට පනිති. ඊට පසු කාලයාගේ ඇවෑමෙන් ඔවුහු පිචන් හා හොරිකඩ කලාකරුවන් බවට පත්වෙති.

එදා භීෂණසමයේ එජාප රජය වෙනස් කරන්නට විපක්ෂය වෙනුවෙන් කඩේගිය කලාකරුවන් බොහොමයකට ජනතාව විසින් ප්‍රගතිශීලි හා ජනතාවාදී ලේබලය ඇලවූහ. බොහෝ පත්තර කාරයන්ද එසේමය. ඩලස් අලහප්පෙරුම විමල් වීරවංශ වැනි පත්තරකාරයන් එදා එජාපය එළවා දැමීමට තම පෑන මෙහෙය වූයේ ජනතාවාදී පත්තරකාරයන් වෙමිනි. කරුණාදාස සූරියආරච්චිද දිවයින හරහා තම පෑන මෙහෙයවූයේ ඒ ජනතාව සඳහාමය. අද ඩලස් අලහප්පෙරුම සේම විමල් වීරවංශද මේ රජයේ ඇමතිවරුය. ජනතාව විඳින පිඩනය හා දුක පිළිබඳව ඔවුනට අද එතරම් සංවේදීතාවක් නැත. කසුරි සිළුමිණෝ කතුවරයා වෙමින් පවතින රජයේ කුණු සුද්ද කිරීමේ කාර්යයේ නිරතව ඇත. කරවටක් ගිලී ජීවත්වීමට දඟලන ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ පෑන අද මෙහෙයවන්නේ නැත.

එලෙසම මහින්දට පෙර බලයේ සිටි චන්ද්‍රිකාව බලයට පත් කරන්නට විශාල කලාකරුවන් පිරිසක් එදා විපක්ෂය වෙනුවෙනු දරදිය ඇද්දෝය. එයින් එක් කලාකරුවෙකු වන්නේ සෝමරත්න දිසානායකයි. ඔහු රචනා කළ සූරිය-කන්ද, මාතර ගඟේ කිඹුලා ආදි භීෂණය අළලා ලියූ ගි, මියගිය තරුණ පිරිස වෙනුවෙන් හඬා වැටෙන ජනතාවගේ සංවේදී හදවත් හඬවන්නට සමත් විය. චන්ද්‍රිකා වෙනුවෙන් කතිරය මෙහෙයවීමට විශාල කාර්යභාරයක් ඉටු කළේය. විජය කුමරණතුංග නමැති කලාකරුවා මානවහිතවාදී කලාකරුවෙකු වූයේ ඔහු සැමදාම විපක්ෂයේ සිටි නිසාය. එජාප රජයේ කඩුවට අසුවෙමින් හිරබත් කමින්, වෙඩි උණ්ඩවලින් බේරි භීෂකයන්ගේ ටී පනස්හයේ වෙඩි උණ්ඩවලින් සිරුර හිල්වන තුරු වෙඩි කෑ විජය, විපක්ෂයේ සිට මානව හිතවාදී වූයෙන් ඔහු තවමත් ජනතාව අතර ජීවත් වෙයි. ටෙලිනාට්‍ය නිළියකව සිටි බර්තෝලමියුස්ගේ අවසාන ගමනට සිටි ජනකායවත් ගාමිණී ෆොන්සේකා වෙනුවෙන් නොසිටියේ ඔහු බල්ටි ගසමින් කඩේ නොව සාප්පු ගිය කලාකරුවකු නිසාය. අන්තිමේදී ඔහු බලයේ සිටි චන්ද්‍රිකා වෙනුවෙන් කඩේ යමින් උතුරු නැගෙනහිර ආණ්ඩුකාර පදවිය හෙබවූයේය, ඒ සමගම චන්ද්‍රිකාගේ සාප්පු සංකීර්ණයේ නැවතී සිටි සනත් ගුණතිලක සමග විරසකවී සියල්ල අත්හැර දැම්මේය. ඒ වනවිට ඔහු ප්‍රමාද වැඩිය. මිය යන විට බොහෝ සිත් තැවුලට පත්ව සිටි සිංහල සිනමාවේ සක්විති නාමය ගත් ගාමිණී ෆොන්සේකා සිය දිවි නසා ගත් බවටද රාවයක් පවතී.

එදා චන්ද්‍රිකා බලයට පත් කරන්නට ඇය ළගම සිටි ප්‍රධාන පෙළේ පුවත් පත් කලාවේදියෙක් වූ වික්ටර් අයිවන්ට වූයේද ඒ සන්තෑසියමය. තමන්ට ලැබෙන දේවල් වලට වඩා නොලැබෙන දේවල් ළගාවෙන කාලය පැමිණෙමින් කඩය හිස් වනවිට ඔහු චන්ද්‍රිකාව අතහැර දමා ඇයට විරුද්ධව විශාල කාර්යභාරයක් ඉටු කළේය. "චෞර රැජින" නැමැති කෘතියෙන් ඔහු ඒ පිළිබඳව මොනවට ඔප්පු කර ඇත. අප රටේ සිටි ජන නායකයන්ගෙන් කලාකරුවන් බිලි බා ගැනිමට ඉතාමත් දක්ෂ වූ නායකයකු වන්නේ රණසිංහ ප්‍රේමදාස මහතායි ඔහු පුංචි වෙළෙන්දා නමින් එදා වේදිකාවේ ගි ගැයූ ළමා ගායකයා පවා තම දේශපාලනය වෙනුවෙන් යොදා ගත්තේය. එච්.ආර්.ජෝතිපාල, මාලනී ෆොන්සේකා ආදී කලාකරුවන් ප්‍රේමදාස ඉදිරි ගමන වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකළ අතර, එච්.ආර්. ජෝතිපාල මිය ගියේද ඔහුගේ වේදිකාවක ගී ගයමින් සිට අසනීප වීමෙනි. නිහාල් සිල්වාට චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂ පදිවියක් පූජා කරමින් තම කඩයට සම්බන්ධ කරගත් එතුමා බොහෝ කලාකරුවන් යකුන් බැඳගත්තා සේ බැඳගෙන වැඩගත් නායකයෙකි.

ඔහුගේ පසු එම කාර්යභාර්‍ය අකුරටම ඉටු කරන නායකයා වන්නේ මහින්ද රාජපක්ෂයි. අද කිසිදු කලාකරුවකු ජනතාව වෙනුවෙන් හඬක් නොනගන තත්වයට පත්ව ඇත. යුධ ජයග්‍රහණයත් සමග ඔහු සමග අත්වැල් බැඳගත් කලාකරුවන් බොහෙර්ය. ඔවුනට හැකි පමණින් තනතුරු ලාභ ප්‍රයෝජන ලබා දෙමින් ණයට බඩු ගන්නට එන ජනතාවට ගිනි ගණන්වලට බඩු කිරන විකුණන කලාකරුවන් විශාල ප්‍රමාණයක් මහින්ද විසින් බිහිකර ඇත. විදුලි බිල වැඩිවීම, බස් ගාස්තු වැඩිවීම, ජීවන වියදම වැඩිවීම ගැන ඔවුන් රජය සාධාරණ කරමින් දූෂණ, වංචා ආදිය ගැන කතා නොකරමින් විශාල මෙහෙවරක් ඉටු කරමින් සිටී. මෑතකදී

## කුට්ටම් පොකුණ



මහින්ද වෙනුවෙන්ම චිත්‍රපටයක් කළ එක් කලාකරුවෙකු එහි ප්‍රධාන මාතෘකාව බව පත් කරවූයේ මහිනද රජාය. කුඩා දරුවකු මහින්ද නැමැති රජා සොයා යන එම චිත්‍රපටිය කාටත් හොරෙන්ම චිත්‍රපට ශාලාවලින් හැලීගියේ යුධ ජයග්‍රහණයද අමතක කරවමිනි. එදා යූ.එන්.පී. රජයේ මන්ත්‍රීවරයකුව සිටි රවින්ද්‍ර රන්දෙනිය අද මහින්දගේ උපදේශකවරයෙකි. රෝහණ වීරසිංහ ද එසේමය. මේ කාටවත්ම වඩා හොඳින් සාප්පුවේ කාර්යභාරය ඉටු කරන කලාකරුවා බවට පත්ව ඇත්තේ ජැක්සන් ඇන්තනීය. ඔහු එදා ප්‍රේක්ෂකයන් වෙනුවෙන් හඬ තැලූ ජව සම්පන්න කඩහඬ පවතින රජයේ කඩේ යාම වෙනුවෙන් මනාව යොදවයි. ඔහු එදා වේදිකාවේ ගායනා කළ "ඔබේ සපත්තුව වැළඳ බඳා - ඔබේ සබුක්කුවේ පහර කකා වැලන්ටයින් උතුමාණෙනි ගීය" අද ඔහුට මනාව ගැලපෙන්නේ ක්‍රම ක්‍රමයෙන් ජනතාවගේ සබක්කුවේ පහරවල් කමිනි.

අද තම වාසිය වෙනුවෙන් කඩේ යන කලාකරුවන් බොහෝය. ප්‍රේමසිරි කේමදාස වැනි අති විශිෂ්ඨ සංගීතධරයන් සේම ජෝ අබේවික්‍රම වැනි ශ්‍රේෂ්ඨ රංගධරයෝ ද මේ කඩයට හිරවී සිටි කලාකරුවෝ වෙති. සිරිල් වික්‍රමගේ නැමැති රංගධරයාද එම කඩයේ කාලයක් හිරවී සිට අවසානයේ සත්‍යය අවබෝධ කරගෙන නිහඬව සිටිනා කලාකරුවෙකි. තම කලා ලෝකය සුවිසල් රුකක් බවට පත් කරගන්නට තිබූ සුගතපාල සෙනරත් යාපා මහතාද එදා පවතින එ.ජා.ප. රජය වෙනුවෙන් කඩේ යන්නට ගොස් තම කලා ජීවිතය අවුල් කරගත් අධ්‍යක්ෂකවරයෙකි. මිනිසා සහ කපුටා නැමැති කෙටි චිත්‍රපටියෙන් සිනමාව අමුතුම මඟකට ගෙන ආ ඔහු චිත්‍රපට දෙක තුනක් අධ්‍යක්ෂණය කරමින් රජය වෙනුවෙන් රජයේ චිත්‍රපට අංශය මෙහෙය වීමට ගොස් තම සිනමා ගමන අඩාල කරගත් අතර අද ජීවිතයේ සැදෑ සමය අසරණව ගත කරන කලාකරුවකි.

අද ඔහු හිස් මල්ලක් රැගෙන කඩේ යන්නේ බඩ ගින්දර නිවාගන්නටය. තමන්ට ලැබෙන තනතුරු නම්බුනාම, මුදල් හදල් වෙනුවෙන් කඩේගිය කලාකරුවන් තුළින් ජනතාව ඈත් වන බව ඔවුනට අවබෝධ වනවිට පෙරහැර ගොස් හමාරය. සරෝජා නමැති තම මුල්ම සිනමා පටයෙන් ජාතිවාදය ප්‍රතික්ෂේප කොට මනුෂ්‍යත්වය පිරි සිනමාරූපී චිත්‍රපටයක් බිහිකළ සෝමරත්න දිසානායක යුධ ජයග්‍රහණයත් සමග කඩයට බැස කඩේටම ගැලපෙන නිර්මාණ කරමින් එම කඩේ ඇතුළේම සිටින අනෙක් කලාකරුවන් සමග අවුල් වියවුල් ඇතිකරගෙන ඇත.

ඇමෙරිකාවේදී ජාත්‍යන්තර සම්මානයක් දිනා දිවයිනට කීර්තියක් ගෙනා ජගත් චමිලගේ සම්මානය ජැක්සන් ඇන්තනි වැනි නළුවෙක් දිනා දිවයිනට ආවානම් පිළිගැනීමේ උත්සවය මිට වඩා වෙනස්වීමට ඉඩ තිබෙන්නේ ජගත් චමිල මේ වනතුරු කඩේ යන කලාකරුවෙකු නොවන නිසාය.

එහෙත් මේ පිළිබඳව කොපමණ කතාකළත් අපේ රටේ ජන්ද දායකයා තවමත් රැවටෙයි. ජනප්‍රිය කලාකරුවාට තවමත් ජනතාව ගොනාට ඇන්දවිය හැකිය. උගත් විනීත ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ජන්දයෙන් පැරදී එක් රැයින් ජනප්‍රිය වූ කලාකරුවන් පාර්ලිමේන්තු යන යුගයක ජයලත් මනෝරත්න වැනි ශ්‍රේෂ්ඨයන් අපට කදිම ආදර්ශකි. ඒනිසා හැමදාමත් කලාකරුවන් සාප්පු යවා තමන්වම රවටගන්නා ජන්දදායකයන් සිටින රටක මෙය චක්‍රයක් සේ නිති කැරකේ. කලාකරුවන්ගේ සෙලෝලයිඩ්, කාඩ්බෝඩ්, පවුඩර් තැවරූ පින්තූර දෙස බලාගෙන පරපුරෙන් පරපුරට, ජන්ද දායකයා නමැති මිනිසා තමන්ගේ කුසගින්දර හැමදාම දරාගෙන මරණය එක අතක තබාගෙන අනෙක් අතින් පැණි ලෙවකමින් සිහින ලොවක ජීවත් වෙති.


